# 8 ශ්‍රේණිය - විද්‍යාව - පැවරුම 1

## 1 කොටස

**වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

1) බැක්ටීරියා මගින් බෝවන රෝගයක් වන්නේ

i. ඩෙංගු ii. ලීෂ්මානියාව
iii. කොරෝනා iv. ක්ෂය රෝගය

2) මෝරා අයත් සත්ත්ව කාණ්ඩය කුමක්ද?

i. මැමේලියා ii. පිස්කේස්
iii. මොලුස්කා iv. නිඩාරියා

3) රූපාන්තරණය පෙන්වන සත්ත්වයක් වන්නේ

i. මී මැස්සා ii. ගෙම්බා
iii. බෙල්ලා iv. පත්තෑපනුවා

4) ප්‍රභාසංස්ලේෂණය සඳහා වායුගෝලයෙන් ලබා ගන්නා සාධකය කුමක්ද?

i. ඔක්සිජන් ii. කාබන්ඩයොක්සයිඩ්
iii. සූර්ය ශක්තිය iv. නයිට්‍රජන්

5) වායුගෝලයෙන් ජලවාෂ්ප අවශෝෂණය කර ගනු ලබන්නේ

i. ආරෝහක මුල් ii. වායව මුල්
iii. කයිරු මුල් iv. වායුධර මුල්

6) තත්පර 5 කදී 100 වාරයක් කම්පනය වන වස්තුවක සංඛ්‍යාතය කුමක්ද?

i. 10 Hz ii. 50 Hz iii. 20 Hz iv. 100 Hz

7) මූලද්‍රව්‍යයක් වන්නේ

i. කොපර සල්ෆේට් ii. කාබන්ඩයොක්සයිඩ් iii. ග්ලූකෝස් iv. ඔක්සිජන්

8) පදාර්ථයක් නොවන්නේ කුමක්ද?

i. වාතය ii. ජලය iii. තාපය iv. චුම්භකය

9) සර්පිලාකාර පත්‍ර වින්‍යාසක් සහිත ශාකයකි

i. පේර ii. රුක්අත්තන iii. අනෝදා iv. තෙබු

10) උත්ස්වේදනය අඩුකිරීම සඳහා සිහින් පත්‍ර ඇත්තේ

i. නවහන්දි ii. දලුක් iii. පතොක් iv. කස

11) කහ පැහැති රසායනික ද්‍රව්‍යකි

i. කොපර සල්ෆේට් ii. සල්ෆර්

iii. පොටෑසියම් පර්මැංගනේට් iv. කොපර්

12) පහත දැක්වෙන ලක්ෂණ සහිත සත්ත්ව කාණ්ඩය කුමක්ද?

- ජේශිමය පාදයක් දරයි
- මෘදු දේහ දරයි
- ද්විපාර්ශවික සමමිතිය දරයි

i. නිඩාරියා ii. මොලුස්කා iii. ඇම්පිබියා iv. ආත්‍රොපෝඩා

13) ජලයේ ද්‍රවාංකය හා තාපාංකය පිළිවෙලින් දක්වා ඇත්තේ

i. 0 ˚C - 0 ˚C ii. 0 ˚C - 100 ˚C

iii. 100 ˚C - 0 ˚C iv. ඉහත කිසිවක් නොවේ

14) වයලීනයක හඬ වෙනස් කලහැකි ආකාරය දැක්වෙන පිළිතුර වන්නේ

i. තන්තුවේ දිග වෙනස් කිරීම ii. තන්තුවේ ඝනකම වෙනස් කිරීම

iii. තන්තුවේ ඇදී ඇති තරම වෙනස් කිරීම iv. ඉහත දැක්වෙන සියල්ලම

15) නරක්වූ පාන් පෙත්තක නිරීක්ෂණය කළ හැකි ක්ෂුද්‍ර ජීවී ආකාරය කුමක්ද?

i. පැරමීසියම් ii. මියුකර්

iii. යීස්ට් iv. ඉහත කිසිවක් නොවේ

16) මිනිසාගේ ශ්‍රවන පරාසය කුමක්ද?

i. 20 Hz- 2000 Hz ii. 200 Hz- 20 000 Hz

iii. 20 Hz- 20 000 Hz iv. 20 Hz- 200 000Hz

17) භංගුර පදාර්ථය කුමක්ද?

i. යකඩ ii. වානේ iii. මිනිරන් iv. තඹ

18) පත්‍ර මගින් ප්‍රජනනය කළ හැකි ශාකයකි

i. ගොටුකොළ ii. නිදිකුම්බා iii. බිගෝනියා iv. ගම්මිරිස්

19) රැහැයියන් හඬ නිපදවනු ලබන්නේ

i. තටු වේගයෙන් චලනයෙනි ii. තටු එකිනෙක ස්පර්ශයෙනි

iii. මුඛ උපාංග මගිනි iv. පාදවල කෙඳි කම්පනයෙනි

20) සංයුක්ත අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ නොහැකි ක්ෂුද්‍ර ජීවී ආකාරය කුමක්ද?

i. පැරමීසියම් ii. මියුකර iii. යීස්ට් iv. කොරෝනා

## 11 කොටස

---

1)

1. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය අසත්‍ය බව (√) හෝ (x) යොදා ලකුණු කරන්න
   i. සෑම ක්ෂුද්‍ර ජීවියෙක්ම තනි සෛලයකින් පමණක් සෑදී ඇත
   ii. පිදුරු පල්වූ ජලයේ යීස්ට් නිරීක්ෂණය කළ හැකිය
   iii. පැරමීසියම් සපත්තු අඩියක හැඩය ගනී
   iv. ඩෙංගු සංයුක්ත අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ හැකිය
   v. මියුකර් මගින් සීනි ද්‍රාවණය එතිල් ඇල්කොහොල් බවට පත් කළ හැකිය
2. විද්‍යාත්මකව පැහැදිලි කරන්න
   i. කාමර උෂ්ණත්වයේදී ආහාර ඉක්මනින් නරක් වන නමුත් ශීතකරණයේදී නරක් නොවී කල් තබා ගත හැකිය
   ii. පරිසරයේ සමතුලිත බව සඳහා ක්ෂුද්‍ර ජීවීන් දායක වේ
3. වාසි හා අවාසි තුන බැගින් යොදා ගනිමින් "ක්ෂුද්‍ර ජීවීන්ගෙන් මිනිසාට ඇති බලපෑම" යන මාතෘකාව යටතේ පුවත්පතකට කෙටි ලිපියක් සකස් කරන්න

2) පහත දී ඇති ශාක යොදා ගනිමින් පිළිතුරු සපයන්න

කෝමාරිකා, ගොටුකොළ,, පෙපරෝමියා, පතොක්, රුක්අත්තන, පේර

i. ජලය සංචිත මාංසල පත්‍රය කුමක්ද?
ii. පත්‍ර මගින් නව ශාක බිහිකරන ශාකය කුමක්ද?
iii. ගොටුකොළ ශාකයේ ඇති සුවිශේෂී කඳ කුමක්ද?
iv. පතොක් කදෙහි අනුවර්තන කෙටියෙන් විස්තර කරන්න
v. රුක්අත්තන හා පේර වල ඇති පත්‍ර වින්‍යාසය කුමක්ද?

vi. ඉහත සඳහන් නොකළ පත්‍ර වින්‍යාස ආකාර නම් කර උදාහරණයක් බැගින් දක්වන්න

vii. කාර්යක්ෂම ප්‍රභාසංසල්ලේෂණ කෘත්‍යයක් සඳහා ශාක පත්‍ර දක්වනි අනුවර්තන මොනවාද?

3)

i. ඝන පදාර්ථයේ අසංතතික ස්වභාවය පරයේෂණාත්මකව පෙන්වීම සඳහා කළ හැකි කියාකාරකමක රූප සටහනක් අඳින්න

ii. පදාර්ථයේ අංශුමය සැකැස්ම දක්වන රූප සටහන් අඳින්න

iii. පහත දක්වා ඇති භෞතික ස්වභායකන් කෙටියෙන් විස්තර කර ඒ සඳහා උදාහරණයක් බැගින් දක්වන්න

a) දෘඩතාව

b) භංගුරතාව

c) තන්‍යතාව

d) ආඝාත්‍යතාව

iv. පහත දැක්වෙන ද්‍රව්‍ය මූල ද්‍රව්‍ය හා සංයෝග ලෙස වෙන් කරන්න

ග්ලූකෝස්, කාබන්, තඹ, ජලය,ලුණු, ක්ලෝරීන්

4)

i. සංගීත නාදය සහ ඝෝෂාව අතර ඇති  වෙනස්කම පැහැදළි කරන්න

ii. සංගීත චිකිත්සාව මගින් සුව කල හැකි රෝග තත්ත්ව මොනවාද?

iii. දිගින් එකිනෙකට වෙනස් පෑන් කොපු තුනක් පිඹීමේදී නිපදවෙන හඬේ සංඛ්‍යාතය වැඩිවන පිළිවෙලට අඳින්න

iv. ඉහලඩ සංඛ්‍යාත ඇසෙන සතුන් දෙදෙනෙකු  නම් කරන්න

v. සංඛ්‍යාතය යනු කුමක්ද?

5)

හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා ලියන්න

(ප්‍රචාරණ, මිශ්‍රණයක්, සංඛ්‍යාතය, සම්පීඩනය, සංයොගයක්, 0 ˚C, වායුධර, 100 ˚C )

i. සරසුලේ දිග වෙනස් කරන විට …………………………….. වෙනස්වේ

ii. වායු පහසුවෙන් …………………………….. කළ හැකිය

iii. පිරිසිදු ජලය ජල වාෂ්ප බවට පත් කළ හැකි උෂ්ණත්වය …………………………….. වේ

iv. සංශුද්ධ ද්‍රව්‍ය  කිහිපයක් එකතු වී …………………………….. සෑදේ

v. පේර ශාකයේ …………………………….. මුල් ඇත

vi. ජලයේ ද්‍රවාංකය …………………………….. වේ

vii. ආසුත ජලය …………………………….. සඳහා උදාහරණයකි

viii. කඩොලාන ශාක වල …………………………….. මුල් දැකිය හැකිය